# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2059/33 - 2018 පෙබරවාරි මස 21 වැනි බදාදා - 2018.02.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම (සංශෝධිත)

*මගේ අංකය:* KDS/TUM/04/01/01/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන උපවගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ, ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත කෝරළයේ, නැගෙනහිර සුළු කොට්ඨාසයේ. හද්දාපිටිය ග්‍රාම නිලධාරි වසමේ මඩවල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 133/18/20 හි පහත සඳහන් කැබලි (2).

01. **කැබලි අංක 646**

ඉඩමේ නම : ගල්කැටියවත්ත ; විස්තරය : විවෘත මුඩුබිම ; හිමිකම් කියන අය : ඩී. එම්. ඩී. බී.දසනායක.

02. **කැබලි අංක 647**

ඉඩමේ නම : ගල්කැටියවත්ත ; විස්තරය : විවෘත මුඩුබිම ; හිමිකම් කියන අය : පූජ්‍ය අන්දරවැවේ පියරතන හිමි.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 24 වැනි දින පෙ.ව. 9.00ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 අප්‍රේල් මස 10 වැනි දිනට මත්තෙන් එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

තුසිතා එන්. ඩබ්. රණසිංහ,  
ප්‍රාදේශීය ලේකම්,  
තුම්පනේ.

2018 පෙබරවාරි මස 16 වැනි දින,  
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03-358




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි වගන්තිය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* MTR/LND/ACQUI/L2/3968.
*ඉ. අ. යොමු අංකය :*4/3/8/2014/පී.සී./276.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිත්තැටිය මැද වසමේ හිත්තැටිය මැද ගමේ මු.පි.මාර 2722 මුලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර හිත්තැටිය මැදගෙදර වත්ත පාර පුළුල් කිරීම සඳහා අත්කර ගනු ලැබේ.

### උපලේඛනය

01. කැබලි අංක 01

ඉඩමේ නම : රතුරාලගෙ වත්ත *හෙවත්* අම්පිටිය වත්ත *හෙවත්* කෝන්ගහහේන ; විස්තරය : ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත ; ඉඩමේ හිමිකම් කියන්නා මාතර, හිත්තැටිය මැද ඩී. ඩී. දහනායක මාවත, අංක 86, පදිංචි හේවා නලගමගේ නිශාන්ත ප්‍රිය; ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.0038.

02. කැබලි අංක 02

ඉඩමේ නම : බටුවිටගෙ වත්ත ; විස්තරය : ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත ; ඉඩමේ හිමිකම් කියන්නා මාතර, හිත්තැටිය මැද ඩී. ඩී. දහනායක මාවත, අංක 88, පදිංචි අමරසිංහ දිසානායක; ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.0029.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මාර්තු මස 13 වැනි දින පෙ.ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 පෙබරවාරි මස 28 වැනි දිනට මත්තෙන් ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩී. ඩී. කේ. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2018 පෙබරවාරි මස 15 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03-359

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.